CSS/03/13/CIR.COM.(2) 2024.10. 07

ආණ්ඩුකාර ලේකම්,
සභා ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරු / සියලුම නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්,
දකුණු පළාත.

**පළාත් සභා මූල්‍ය රීති 562 ප්‍රකාර ව, මධ්‍යම රජයේ චක්‍රලේඛ දකුණු පළාත් සභාව සඳහා අදාළ කර ගැනීම - රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/2021**

උක්ත කරුණ සම්බන්ධයෙන් මා ඇමතු දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක SP/PSC/05/01/30 හා 2024.09.18 දිනැති ලිපිය හා බැඳේ.

02. එමඟින්, පහත සටහනේ දක්වා ඇති චක්‍රලේඛයේ විධිවිධාන එම චක්‍රලේඛය නිකුත් කළ දිනය වන 2021.11.22 දින සිට දකුණු පළාත් සභාව තුළ ක්‍රියාත්මක කිරීම සඳහා 2024.09.11 දින දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය ලැබී ඇති බව මා වෙත දැනුම් දී ඇත.

| අනු අංකය | චක්‍රලේඛය නිකුත් කළ ආයතනය | චක්‍රලේඛ අංකය | නිකුත් කළ දිනය | චක්‍රලේඛයේ ශීර්ෂය |
|---|---|---|---|---|
| 01. | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 22/2021 | 2021.11.22 | රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික සහ මාණ්ඩලික නොවන නිලධර ගණය වර්ගීකරණය |

03. ඒ අනුව, උක්ත කරුණ සම්බන්ධයෙන් අදාළ ආයතන දැනුවත් කරන මෙන් කාරුණික ව දන්වා සිටිමි.

අනිල් වික්‍රමසේකර
නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පාලන)
ප්‍රධාන ලේකම් වෙනුවට
දකුණු පළාත

84

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 22/2021

මගේ අංකය : EST 5/6/9/11
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2021.11.22

අමාත්‍යාංශ ලේකම්වරුන්
රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික සහ මාණ්ඩලික නොවන නිලධර ගණය වර්ගීකරණය

"රාජ්‍ය සේවයේ වැටුප් සංශෝධනය - 2016" මැයෙන් නිකුත් කළ 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 හා "රාජ්‍ය සේවයේ හා පළාත් රාජ්‍ය සේවයේ මාණ්ඩලික හා මාණ්ඩලික නොවන නිලධර ගණය වර්ගීකරණය" මැයෙන් නිකුත් කළ 2017.12.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/2017 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 ක්‍රියාත්මක වන දිනට පෙර පැවති විධිවිධාන යටතේ මාණ්ඩලික ශ්‍රේණියට ඇතුළත් වී තිබූ තනතුරු තවදුරටත් මාණ්ඩලික ශ්‍රේණියෙහිලා සැලකීමට 2021.07.05 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත. ඒ අනුව, 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016හි 11.3 වගන්තිය හා 2017.12.07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 32/2017හි 03 ඡේදය යටතේ ඇති 11.3 වගන්තිය පහත පරිදි සංශෝධනය විය යුතු ය.

> **"11.3 මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වන දිනට පැවති විධිවිධාන යටතේ මාණ්ඩලික ශ්‍රේණියට ඇතුළත් වී තිබූ යම් තනතුරක් තවදුරටත් මාණ්ඩලික ශ්‍රේණියෙහි ලා සලකනු ලබයි."**

03. මෙම සංශෝධනය 2021.07.05 දින සිට බලාත්මක වේ.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය සේවා, පළාත් සභා හා
පළාත් පාලන අමාත්‍යාංශය

මෙම රාජ්‍ය පරිපාලන/ ~~රාජ්‍ය~~ 22/2021
.................... චක්‍රලේඛය / ~~උපදෙස්~~
~~ලිපිය~~ බලාත්මක ... දින සිට
දකුණු පළාත් ...ට අදාල කර ගැනීම සඳහා
ගරු ආණ්ඩුකාරතුමන්ගේ අනුමැතිය 2024/1/11
දින ලබා දී ඇති බව සහතික කරමි.
....................
~~ආණ්ඩුකාර ලේකම්~~ / ~~සහකාර ලේකම්~~ / ~~සජිත්~~ එච්.ඩී.ඩී.එස්.ඩී.හේරත්
සහකාර ලේකම්
ආණ්ඩුකාර ලේකම් කාර්යාලය
දකුණු පළාත